# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | අප අවට ඇති දේ | ඒකකය - 02 |
|---|---|---|

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

1. ඝන පදාර්ථය සඳහා උදාහරණ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

   a. යකඩ ඇණ, පෑන, පොල් තෙල්　　b. ජලය, අයිස්, පොත

   c. හිම, වැලි, අයිස්　　d. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්

2. ස්කන්ධයක් සහිත දේ අඩංගු පිළිතුර වන්නේ,

   a. ආලෝකය　b. ඔක්සිජන් වායුව　c. තාපය　d. ශබ්දය

3. අවකාශයේ ඉඩක් නොගන්නා දේ අඩංගු පිළිතුර වන්නේ,

   a. පෑන　b. පොත　c. ශක්තිය　d. විදුරුව

4. ස්කන්ධයක් ඇති සහ අවකාශයේ ඉඩක් ගන්නා දේවල් හැඳින්වෙන නම වන්නේ,

   a. තාපය　b. ආලෝකය　c. පොත　d. පදාර්ථය

5. හිරුඑළිය ශක්ති ආකාරයක් ලෙස හැඳින්වෙන්නේ,

   a. ස්කන්ධයක් ඇති නිසා　　b. ඉඩක් ගන්නා නිසා

   c. ස්කන්ධයක් හෝ ඉඩක් නොගන්නා නිසා　　d. ඉඩක් නොගන්නා නමුත් ස්කන්ධයක් ඇති නිසා

6. වායු පදාර්ථ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

   a. ජලය,ජලවාෂ්ප　b. හිරුඑළිය,ජලවාෂ්ප　c. ජලවාෂ්ප,ඔක්සිජන්　d. ඔක්සිජන් ,යකඩ

7. නිශ්චිත පරිමාවක් ඇති නමුත් නිශ්චිත හැඩයක් නොමැති ද්‍රව්‍ය අඩංගු පිළිතුර වන්නේ,

   a. අල්මාරිය　b. ගිණිපෙට්ටිය　c. පොල්කිරි　d. පිඟාන

8. භංගුරතාව පෙන්වන ද්‍රව්‍යක් වන්නේ,

   a. යකඩ ඇණය　b. විදුරුව　c. පොත　d. රබර්

9. සිනිඳු වයනයක් ඇති ද්‍රව්‍යක් නොවන්නේ,

   a. වැලි කඩදාසි　b. පුයර　c. කොස්ලෙලි　d. කළුගල්

10. රත්රන් භාණ්ඩ සෑදීමට හැකිවන්නේ රත්රන් සතු කවර ගුණාංගයක් නිසාද?

    a. භංගුරතාව　b. තන්‍ය බව　c. ප්‍රත්‍යස්ථ බව　d. සිනිඳු බව　　(ලකුණු 10)

**රචනා ප්‍රශ්න**

1. (A) පහත වාක්‍ය හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද කොටුව තුළ යොදන්න'

| | |
|---|---|
| වාතය අවකාශයේ ඉඩක් ලබා ගනී. | |
| මේසය ඝන පදාර්ථයකි. | |
| ශබ්දය ශක්ති ආකාරයක් නොවේ. | |
| හිස් බැලුම් බෝලයකට හුළං පිරවූ විට ස්කන්ධය වැඩි වේ. | |
| ජලයට නිශ්චිත හැඩයක් ඇත. | |

(B) හිස්තැනට සුදුසු වචන තෝරා සම්පූර්ණ කරන්න.

අප අවට පරිසරයේ අඩංගු දේවල් ..........................සහ ශක්ති ලෙස බෙදා දැක්විය හැක. අවකාශයේ ඉඩක් ගන්නා සහ .........................ඇති දේ පදාර්ථ ලෙස හැඳින්වේ. පදාර්ථය ඝන,ද්‍රව, .......................... ලෙස අවස්ථා තුනකට බෙදිය හැක. ඝන පදාර්ථ වලට නිශ්චිත හැඩයක් හා නිශ්චිත .......................... ඇත. ද්‍රව පදාර්ථ වලට නිශ්චිත හැඩයක් නැති අතර නිශ්චිත පරිමාවක් .......................... . වායු පදාර්ථ වලට නිශ්චිත හැඩයක් හා නිශ්චිත පරිමාවක් නැත.

( වායු / ඇත / පදාර්ථ / ස්කන්ධයක් / පරිමාවක් ) (ලකුණු 10)

2. ඔබ පාසලේදී සිදුකල ක්‍රියාකාරකම් දෙකකට අදාළ රූප සටහන් a හා b ලෙස පහත දැක්වේ.

(a)




(b)




i. ඉහත a හා b ඇටවුම් යොදාගනිමින් නිරීක්ෂණය කළ හැක්කේ කවර පදාර්ථයක් සතු ලක්ෂණ පිළිබඳවද?

ii. ඉහත ඇටවුමේ එක් බැලූනයක නූල කැපුව හොත් මීටර් කෝදුවේ සමබරතාවයට කුමක් සිදුවේද?

iii. ඝන ද්‍රව වායු යන පදාර්ථ තුනටම පොදු ලක්ෂණයක් සඳහන් කරන්න.

iv. ද්‍රව සහ වායු යන පදාර්ථ දෙකටම පොදු ලක්ෂණයක් සඳහන් කරන්න.

v. ද්‍රව පදාර්ථය සතු වායු පදාර්ථයට නොමැති ලක්ෂණය කුමක්ද?

vi. විදුරු කැපීමට දියමන්ති භාවිතා කරන්නේ දියමන්ති සතු කවර ගුණාංගයක් නිසාද?

vii. රේඩියෝවෙන් නිකුත් වන ශක්ති ආකාරය කුමක්ද?

viii. නිවසේ බහුලව භාවිතා වන ශක්ති ආකාරයක් නම් කරන්න. (ලකුණු 08)

The National e-Learning Portal for the General Education

3. (a) පහත සඳහන් ද්‍රව්‍ය ඝන ද්‍රව වායු ලෙස වගුව තුල දක්වන්න.

(පොල් තෙල්, ගල්කැටය, පෑන, ජලවාෂ්ප, පුළුන්, ඔක්සිජන්, රත්‍රන්, අගුරු, වතුර, සහල්)

| ඝන | ද්‍රව | වායු |
|---|---|---|
| | | |

(b) පරිසරයේ ඇති ශක්ති ආකාර තුනක් ලියන්න.

(c) ස්කන්ධය මැනීමට භාවිතා කල හැකි ඒකක දෙකක් නම් කරන්න. (ලකුණු 15)

4. (a) වාතය අවකාශයේ ඉඩක්ගන්නා බව පෙන්වීමට සිදුකල හැකි ක්‍රියාකාරකමක රූපසටහනක් ඇඳ නම් කරන්න.

(b) පුයර අතින් ඇල්ලූ විට සිනිඳු බවක්ද වැලි රළු බවක්ද දැනෙයි මෙම ගුණාංගය හඳුන්වන නම ලියන්න.

(c) භංගුරතාව පෙන්වන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

(d) රබර් වල ඇදෙන සුළු බව හඳුන්වන නම කුමක්ද?

(e) තන්‍යතාව යනු කම්බි සතු ගුණාංගයකි. තන්‍යතාව යන්නෙහි තේරුම කුමක්ද?

(f) ආඝන්‍යතාව පෙන්වන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න' (ලකුණු 07)